# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2077/39 – 2018 ජුනි 29 වැනි සිකුරාදා – 2018.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඕඑම්/02/සී/2014/77.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2016.02.03 දිනැති හා අංක 1952/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.01.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බිංගිරිය, පෙරකදෝරුවත්ත හි පදිංචි එම්. ඒ. එස්. පී. සේනාරත්න මයා. හා අනෙක් පාර්ශ්වය වශයෙන් රාජගිරිය, රජමල්වත්ත පාර, අංක 82 හි පිහිටි රාජ්‍ය දැව සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.03.29 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජුනි මස 22 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 27958 – 09 (2018/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: අයිආර්/සීඕඑම්/02/සී/2014/77.

**කාර්මික අධිකරණයේ දී ය.**

*එක් පාර්ශවයක් වශයෙන්,*

එම්. ඒ. එස්. පී. සේනාරත්න මයා., පෙරකදෝරුවත්ත, බිංගිරිය.

*නඩු අංකය: ඒ - 3627*

සහ

අනෙක් පාර්ශවය වෙනුවෙන්,

රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, රාජගිරිය.

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි.

**ප්‍රදානයයි**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමන් වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බත්තරමුල්ල, පන්නිපිටිය පාරේ, අංක 77 හි ටී. පියසෝම වන මා පත් කර, මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"රාජ්‍ය දැව සංස්ථාවේ රත්නපුර ප්‍රාදේශිකයේ වැඩබිම් නිලධාරී තනතුරෙහි සේවය කළ එම්. ඒ. එස්. පී. සේනාරත්න මහතාහට 2011.08.24 දිනැති චෝදනා පත්‍රය මත විනය පරීක්ෂණයක් පවත්වා ලබාදී ඇති දඬුවම් යුක්ති සහගත වන්නේ ද යන්නත්, එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට ලබා දියයුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

2016.07.07 වැනි දින බේරුම්කරණය ඉදිරිපිටදී පාර්ශවයන් පෙනී සිටි අතර එදින දෙපාර්ශවයන් අතර සමථයකට පත් වී ඇත.

ඉන් අනතුරුව 2016.08.16 වැනි දින ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් නීතිඥ සුමුදු සේනාරත්න මහත්මිය සමඟ නීතිඥ සුසන්ත ගුණසේකර මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නීති නිලධාරිණී දිලානි කාරියවසම් මහත්මිය පෙනී සිට ඇත. එදින වගඋත්තරකාර පාර්ශවය විසින් පළමුවන පාර්ශවකරුගේ කොමර්ෂල් බැංකු අංක 8430018735 දරන ගිණුමට බැරවන පරිදි කොළඹ බම්බලපිටිය, ලංකා බැංකු ශාඛාවේ අංක 722747 හා 2016.09.20 වැනි දින පළමුවන පාර්ශවකරුට හිමි රු. 1,066,706.21 මුදල චෙක්පතක් මඟින් දෙවන පාර්ශවයට භාරදෙන ලද 2016.09.20 දිනැති ලියවිල්ලට පළමුවන පාර්ශවකරු සහ දෙවන පාර්ශවකරු විසින් ඔවුන්ගේ අත්සන තබා ඇති බැවි මෙම සමථය දෙපාර්ශවය ම පිළිගන්නා ලදී.

මේ අනුව කාර්මික ආරාවුල බේරුම්කර ගන්නා ලදී.

නීතිඥ ටී. පියසෝම,
බේරුම්කරු.

2018 මාර්තු මස 29 වැනි දින දී ය.

07 – 430

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.